# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2102/22 - 2018 දෙසැම්බර් මස 18 වැනි අඟහරුවාදා - 2018.12.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උතුරු මැද පළාතේ පළාත් සභාව

නිවේදනයයි

**1998 අංක 01 දරන උතුරු මැද පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රඥප්තියේ II වන කොටස II (ඹ) වගන්තිය යටතේ වූ නිවේදනයයි.**

1998 අංක 01 දරන උතුරු මැද පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රඥප්තිය යටතේ උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරවර ඇම්. පී. ජයසිංහ වන මා හට පැවරී ඇති බලතල ප්‍රකාරව, එකී ප්‍රඥප්තියේ II වන කොටසේ II (ඹ) වගන්තිය අනුව, උතුරු මැද පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ග රක්ෂිත සීමාවේ ප්‍රදර්ශනය කරනු ලබන නාම පුවරු හා දැන්වීම් පුවරුවලින් පහත සඳහන් පරිදි අය කිරීම් සිදුකරන බව මෙයින් දැනුම් දෙමි.

නාම පුවරු හා දැන්වීම් පුවරු

| නාම පුවරු හෝ දැන්වීම් පුවරු වර්ගය | නාම පුවරු හෝ දැන්වීම් පුවරුවල ප්‍රමාණය | වාර්ෂික කුලී ගාස්තුව (රු.) | සේවා ගාස්තුව (රු.) | ආපසු ගෙවන තැන්පතු මුදල (රු.) |
|---|---|---|---|---|
| අතිවිශාල | වර්ග මීටර් 50 ට වැඩි | 3,000.00 වර්ග මීටර්/වසරකට | 10,000.00 ඒකකයකට | 30,000.00 ඒකකයකට |
| විශාල | වර්ග මීටර් 50 හෝ 50 ට අඩු සහ වර්ග මීටර් 30 ට වැඩි | 3,000.00 වර්ග මීටර්/වසරකට | ඒකකයකට 6,500.00 | 12,000.00 ඒකකයකට |
| මධ්‍යම | වර්ග මීටර් 30 හෝ 30 ට අඩු සහ වර්ග මීටර් 15 ට වැඩි | 3,000.00 වර්ග මීටර්/වසරකට | 5,000.00 ඒකකයකට | 12,500.00 ඒකකයකට |
| කුඩා | වර්ග මීටර් 15 හෝ 15 ට අඩු සහ වර්ග මීටර් 05 ට වැඩි | 3,000.00 වර්ග මීටර්/වසරකට | 4,000.00 ඒකකයකට | 6,500.00 ඒකකයකට |
| ඉතා කුඩා | වර්ග මීටර් 05 හෝ 05 ට අඩු සහ වර්ග මීටර් 01 ට වැඩි | 3,000.00 වර්ග මීටර්/වසරකට | 2,000.00 ඒකකයකට | 3,250.00 ඒකකයකට |
| | වර්ග මීටර් 01 හෝ 01 ට අඩු | 5,000.00 | 1,000.00 | - |


1A - PG 4336 — 32 (2018/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ධජ **(Banners. Cut-outs and Flags)**

| කාල සීමාව | ප්‍රමාණය | ගාස්තුව (රු.) | ආපසු ගෙවන තැන්පතු මුදල (රු.) |
|---|---|---|---|
| සති 01 ක් හෝ සති 01 ට අඩු | වර්ග මීටර් 02 ක් හෝ වර්ග මීටර් 02 අඩු | 200.00 | 100.00 |

සටහන

* මේ සඳහා රජය මගින් අයකරන බදු මුදල් ගෙවීමට යටත්වනු ඇත.

* වාණිජ්‍යමය පරමාර්ථයෙන් ප්‍රදර්ශනය කරනු නොලබන පුවරු සඳහා වාර්ෂික ගාස්තුව සාමාන්‍යාධිකාරීවරයාගේ අනුමැතිය මත අය නොකිරීමේ හැකියාව ඇත.

ඇම්. පී. ජයසිංහ,
ආණ්ඩුකාරවර,
උතුරු මැද පළාත.

2018 නොවැම්බර් මස 21 වැනි දින.

01 - 38/1

---

## උතුරු මැද පළාතේ පළාත් සභාව

### 1998 අංක 01 දරන උතුරු මැද පළාතේ පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රඥප්තියේ ll වන කොටස 10(2) උප වගන්තිය යටතේ වූ නිවේදනයයි.

1998 අංක 01 දරන උතුරු මැද පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රඥප්තිය යටතේ උතුරු මැද පළාත් ගරු විෂයභාර අමාත්‍ය හා ගරු ආණ්ඩුකාරවර ඇම්. පී. ජයසිංහ වන මා හට පැවරී ඇති බලතල ප්‍රකාරව, එකී ප්‍රඥප්තියේ ll වන කොටසේ 10 (2) උප වගන්තිය අනුව, උතුරු මැද පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ "සී" හා "ඩී" ශ්‍රේණියට අයත් මාර්ගවල රක්ෂිත සීමාව හා ගොඩනැගිලි ඉදිකිරීම් සීමාව පහත අයුරින් සලකනු ලබන බව මෙයින් දැනුම් දෙමි. මෙම නිවේදනය 2018.01.01 දින සිට බලාත්මක වේ.

**උතුරු මැද පළාත් සභාව යටතේ පාලනය වන සී හා ඩී ශ්‍රේණියට අයත් මාර්ගවල රක්ෂිතය, මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට දෙපසට මීටර් 10 ක් වශයෙන් ද, ගොඩනැගිලි ඉදිකිරීම් සීමාව මධ්‍ය රේඛාවේ සිට දෙපසට මීටර් 15 ක් වශයෙන් ද සලකනු ලැබේ.**

ඇම්. පී. ජයසිංහ,
ආණ්ඩුකාරවර,
උතුරු මැද පළාත.

01 - 38/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.